**ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මාණ්ඩලික විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මාණ්ඩලික විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මාණ්ඩලික විද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මාණ්ඩලික විද්‍යාලෙයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මාණ්ඩලික විද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හෙයියන්තුඩුව තරුණ සේවා සභාවට අයත් අක්කර 11 ක ඉඩම තුල විද්‍යාලය විසින් ගොඩනැගිලි ඉදිකර ඒවා භාවිතයට ගනිමින් පැවතියද එම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පවරාගෙන නොතිබුණි. රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 87(අ) අනුව මෙම හිමිකම සීමාවීම පිළිබද මූල්‍ය ප්‍රකාශන තුල හෙලිදරව් කල යුතු වුවද අයිතිය සීමාවීම පිළිබද මූල්‍ය ප්‍රකාශන තුල හෙලිදරව් කර නොතිබුණි | මේ වන විට එම ඉඩමේ අයිතිය පවරා ගැනිම සදහා අවශ්‍ය කටයුතු කරමින් පවතින අතර, මේ පිළිබදව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 හි 87 (අ) අනුව කටයුතු කිරිමට සටහන් කර ගන්නා ලදි. . | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වල නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ හා උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමනාකරණය විසින් සිදුකල යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 47 ඡේදය අනුව වත්කම් වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් මාණ්ඩලික විද්‍යාලයේ රු.මිලියන 1,352.15 ක් වටිනා ඉඩම් සහ ගොඩනැගිලි විද්‍යාලයේ ආරම්භක වර්ෂය වූ 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය | ආයතනයේ වත්කම් තක්සේරු කර තක්සේරු දෙපාර්තුමේන්තුව මගින් 2019 වර්ෂය අවසානයේ තක්සේරු වාර්තාව ලබාදි ඇත. නමුත් මෙහි ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර නොතිබුණි. ඒ අනුව නැවත තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත දැනුම්දි ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වල නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ හා උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමනාකරණය විසින් සිදුකල යුතු වීම. |

| | | |
|---|---|---|
| දක්වා ප්‍රත්‍යාගණනය කර වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී එකම පංතියකට අදාල සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් තුල ගැලපීම් කල යුතු වුවත් ඒ පිළිබඳ නොසලකා පිරිවැය රු.388,277,669 ක වත්කම් අයිතම 2060 ක් 2019 දෙසැම්බර් 30 දින ප්‍රත්‍යාගණනය කර තිබුණු නමුත් ක්ෂය වී අවසන් අයිතම 257 ක පිරිවැය රු.55,164,837කට අදාල රු.33,477,246 ක ප්‍රත්‍යාගණන වටිනාකම පමණක් ගිණුම් තුල ගැලපීම් කර තිබුණි | වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)යුධ හමුදාව විසින් මාණ්ඩලික විද්‍යාලයට ලබාදී තිබුණු රු.1,375,000 ක් වටිනාකම සහිත ලැන්ඩ් කෲෂර් ජීප් රථය 2020 ඔක්තෝබර් 14 දින යුධ හමුදාව වෙත නැවත භාරදී ඇතත් එම ජීප් රථයේ වටිනාකම වාහන ගිණුමෙන් හා සමුච්චිත ක්ෂය ගිණුමෙන් ඉවත් කර නොතිබුණි. ඒ අනුව විද්‍යාලයේ වාහන වටිනාකම රු.1,375,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | යුධ හමුදාව වෙත UHA 4841 දරණ ලැන්ඩ් කෲෂර් ජීප් රථය 2020 ඔක්තෝබර් මස නැවත භාරදීම 2021 අප්‍රේල් මස ජ'නල් සටහනක් මගින් නිරවුල්කර ඇත. | නැවත භාරදී ඇති සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් අත්හල දේපල පිරියත හා උපකරණ වල අගය මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කල යුතු වීම |
| (ආ) 2020 දෙසැම්බර් 16 දින විද්‍යාලය වෙත ලැබී තිබුණු රු.1,246,900 ක් වටිනා පරිගණක හා උපාංග ගිණුම්ගතකර එයට අදාල ක්ෂය ගැලපීම්ද සමග මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | පරිගණක හා උපාංග මිළදී ගැනීමට අදාල සටහන් 2021 අප්‍රේල් මස ජ'නල් සටහනක් මගින් නිරවුල්කර ඇත | සමාලෝචිත වර්ෂයේදී ලැබී ඇති දේපල පිරියත හා උපකරණ අගය මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්ගත කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල රු.2, 506,916 ක වියදම් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල විද්‍යාලයේ පුනරාවර්තන වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් සහ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | උපචිත වියදම් 2021 අප්‍රේල් මස ජ'නල් සටහනක් මගින් නිවැරදි කර ඇත. | සමාලෝචිත වර්ෂය අවසානයට පවතින උපචිත වියදම් මූල්‍ය ප්‍රකාශන තුල නිරූපනය කල යුතු වීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ඉන්ධන මිලදී ගැනීම වෙනුවෙන් යුධ හමුදාවට ගෙවිය යුතු රු. 10,992,853 ක ණය ශේෂය වර්ෂ 5 කට වැඩි කාලයකසිට පියවා නොතිබුණි. | ඉන්ධන මිලදී ගැනීම් වලට අදාලව එම මුදල් කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා ආරක්ෂක අමාත්‍යාංශය මගින් භාණ්ඩාගාරය වෙත යොමුකර ඇති අතර, අදාල අනුමැතිය ලද පසු යුධ හමුදාව මගින් මෙම කපාහැරීම සිදු කරනු ඇත. ඒ අනුව මේ වන විට මෙම වටිනාකම පොත් වලින් ඉවත්කර ගැනීමට කටයුතු කරමි. | ගෙවිය යුතු මුදල් කඩිනමින් අදාල පාර්ශවයන් වෙත ගෙවා නිම කිරීමට කටයුතු කල යුතු වීම හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කල යුතු වීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ)රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වේ අංක PF/FD/04/198 දරණ හා 2016 ජනවාරි 05 සඳහා දිනැති ලිපිය. | මාණ්ඩලික විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය සඳහා ලබාදෙන ආපදා ණය යෝජනා ක්‍රමයට අදාල ණය ලබාදීම හා අයකර ගැනීම් වලට අදාල කොන්දේසි | මේ සම්බන්ධව කමිටුවක් පත්කර අදාල වක ලේඛණ නිකුත් කිරීම හෝ ව්‍යවස්ථාවන් සකස් කිරීමට සටහන් කර ගන්නා ලදි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ ආපදා ණය යෝජනා ක්‍රමය සඳහා ක්‍රියාත්මක කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ඇතුලත් චක්‍රලේඛයක් නිකුත් කිරීම හෝ ව්‍යවස්ථාවක් සකස් කර නොතිබුණි. | | |
| (ආ)1980 අංක 46 දරන සේවා නියුත්තිකයන් ගේ භාර අරමුදල් පනත | විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2009 වර්ෂයේ සිට දායක මුදල් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ගෙවා නොතිබුණි. | විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය රාජ්‍ය සේවා දායක අරමුදල සඳහා 2009 වර්ෂයේ සිට දායක වී ඇති අතර, මේ වන විට EPF හා ETF අරමුදල් සඳහා දායක කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. මේ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට ලිපි ඉදිරිපත්කර ඇත. අනුමැතිය ලද වහාම සිවිල් වේතනය එම අරමුදල් සඳහා දායක කර ගැනීමට කටයුතු කරමි | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත ප්‍රකාරව මාණ්ඩලික විද්‍යාලය කටයුතු කල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 27,963,274 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 14,159,390 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,803883 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම රු.5,442,823 කින් වැඩි වීම සහ මෙහෙයුම් වියදම් රු.9,423,756 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය සිව්මහල් විභාග ශාලා සහ පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 ඔක්තෝබර් 06 දින රු.115,878,415 කට කොන්ත්‍රාත් සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණි. 2018 දෙසැම්බර් 31 වන විට ගොඩනැගිල්ලේ | පවතින ජල කාන්දුව පිළිසකර කර ගැනීම සඳහා විද්‍යාලීය පුස්තකාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ලින්ක් ඉංජිනියරින් පුද්ගලික සමාගම විසින් ඉදිකරන ලද අතර, ගොඩනැගිල්ල භාරදීමෙන් අනතුරුව මිලියන 7.3 ක් අවසාන බිල් සහ රඳවාගැනීම් ලෙස රඳවා ගන්නා ලදි. නමුත් | ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය පිළිබද අවසාන බිල්පත් ගෙවීම් කිරීමට පෙර සමාලෝචිතගත කල යුතු අතර දෝෂ පවතීනම් කඩිනමින් පිළිසකර කරගැනීමට කාර්යක්ෂමව හා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදවිය යුතු වීම. |

වැඩ අවසන් කිරීමට අදාල අවසන් බිල්පත ලබා දී තිබුණි. එසේ වුවද එම ගොඩනැගිල්ලේ ඉහල මහලේ ජල කාන්දු වීමක් නිසා විද්‍යාලය විසින් බිල්පත් ගෙවීම අත්හිටුවා තිබුණි. වර්තමානයේ වන විට බිල්පත් ගෙවීම අත්හිටුවා වසර දෙකක් ගතවී තිබුණද ජල කාන්දු වීම සම්බන්ධයෙන් අලුත්වැඩියා කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි

වගකීම් කාලසීමාව තුලම හතරවන තට්ටුවෙන් ජලය පහත මහල් වෙත කාන්දුවී විදුලි පරිපථ වලට හානිවූ අතර, පහත මහලයන් පරිහරණයට නුසුදුසු තත්වයට පත්වන ලදි. මෙම වතුර කාන්දුව පිලිසකර කරදෙන ලෙස කීහිප අවස්ථාවකදීම අදාල සමාගම වෙත දැනුවත් කලද ඒ සඳහා නිසි පිළිතුරක් හෝ නිසි ක්‍රියාදාමයක් නොගැනීම හේතුවෙන් අදාල ආයතනයෙන් අවැසි නීති උපදෙස් ලැබී ඇත. ඒ අනුව ක්‍රියාකොට ඉංජිනේරු සේවා අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් අවශ්‍ය තාක්ෂණික පිරිවිතර ලබාගෙන ඇති අතර, ඉදිරියේදී ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට අනුව ලංසු කැඳවීමට නියමිතව ඇත. තවද මේ සම්බන්ධයෙන් ලින්ක් ඉංජිනේරු ආයතනයටද ලිඛිතව දැනුවත් කොට ඇත.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයේ දී මාණ්ඩලික විද්‍යාලයේ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 18 ක්ද ද්විතික මට්ටමේ පුරප්පාඩු 06 ක් හා තෘතික මට්ටමේ පුරප්පාඩු 02 ක්ද පැවති අතර එම තනතුරු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුවී නොතිබුණි | ප්‍රාථමික සේවයට අයත් කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමේ චක්‍රලේඛ අංක 02/2020 හා 2020 ඔක්තෝබර් 26 දිනැති කළමණාකරන සේවා චක්‍ර ලේඛණය මගින් අත්හිටුවා තිබේ. තවද විද්‍යාලයට අනුමත කර ඇති බඳවා පටිපාටිවල පත්වීමේ ස්වාභාවය කොටසේ පවතින නොගැලපීම් නිවැරදිකර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, නිවැරදි පත්වීමේ ස්වාභාවය කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව වෙතින් සනාථකර එවීමෙන් පසු පුරප්පාඩුව පවතින ද්විතීක ශ්‍රේණියේ තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ | සමාලෝචිත වර්ෂය අවසානයට පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කලයුතු වීම. |